අවුරුදු උදානය (බක්මහ උළෙල) - සෙන්ට් ඔල්බන්ස් සිංහල භාෂා පාසල

මහින්ද දිසානායක දිවුල්ගනේ.

යම් ජාතියක අනන්‍යතාව හඳුන්වන සලකුණ වූ භාෂාව තුල ඔවුන්ගේ සංස්කෘතිය හැදියාව හා චාරිත්‍ර වාරිත්‍ර ආදී හැම ලක්ෂණයක්ම ගැබ් වී තිබේ. එවන් උසස් වූ භාෂාව ආරක්ෂා කර ගැනීම ඔවුන්ගේ පරම යුතුකමක් ද වේ. එම යුතුකම ආරක්ෂා කරගැනීමේ පරම අභිලාශයෙන් මේ ආරම්භ කර ඇති සිංහල භාෂා පාසල් ප්‍රමාණය සීමිත වුවද එයින් දරුවන්ට සිදුවන සේවය අප්‍රමාණ බව පැවසීම අතිශයෝක්තියක් නම් නොවනු ඇත. භාෂාව ආගම ධර්මය ඉගැන්වීම හැරුණුකොට සංස්කෘතික උත්සව පැවැත්වීම දරුවන්ගේ දැණුම ආකල්ප කුශලතා වර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් වේ. මේ පවත්වන උත්සව අතරින් සිංහල අළුත් අවුරුදු සමරමින් සංවිධානය කරනු ලබන අවුරුදු උත්සවය විශේෂ ස්ථානයක් ලබාගනියි.

මේ අනුව අලේ රොක්බෑන්ක් පාරමිතා බෞද්ධ විහාරයට අනුබද්ධිත සෙන්ට් ඔල්බන්ස් සිංහල භාෂා පාසල ආරම්භයේ සිට පවත්වාගෙන එන අලුත් අවුරුදු උත්සවය මෙවරත් අප්‍රේල් මස 7 වෙනිදා අතිදුන්කර්ෂවත් ලෙස පැවැත්වීමට කටයුතු සංවිධානය කොට තිබේ. පාසලේ දරුවන් දෙමාපියන් හා ප්‍රදේශවාසී විශාල පිරිසක් සහභාගිවන මෙම උත්සවයේ ප්‍රමුඛ ස්ථානය ගනු ලබන්නේ සිංහල චාරිත්‍ර වීධි මෙන්ම ක්‍රමයෙන් සිංහල ජනතාවගෙන් ඉවත්වීගෙන යන කෙලි සෙල්ලම් ය.

මේ සියල්ලට පෙර සිංහල අවුරුද්දේ ඉතිහාසය ගැන සොයා බැලීම වැදගත් වේ කෘෂිකාර්මාන්තය ජීවනෝපාය කරගත් අපේ ජනතාව හිරු සඳු වැස්ස වැනි ස්වභාව ධර්මයෙන් අපට ලබාදුන් වස්තූන් දේවත්වයෙන් සැලකීමට පුරුදු වී සිටියහ. කෘෂිකර්මාන්තය සඳහා ලැබුණු ඒ අපරිමිත වූ සහාය නිසාම හිරු දෙවියන් වැස්ස වලාහක දෙවියන් ආදී වශයෙන් ඒ වස්තු නම් කිරීමට පුරුදු වී සිටියෝය. මේ නිසාම සිංහල අවුරුද්දේ පළවෙනි අංගයක් වන්නේ මෙම කෘෂිකර්මාන්තය සඳහා සහාය වූ දෙවියන් උදෙසා පුද පූජා පැවැත්වීමයි.

අප්‍රේල් මාසය ලඟාවන විට දී මුළු පරිසරයම අළුත් ප්‍රබෝධයකින් අවදි වෙයි. විශේෂයෙන් අපේ රටේ අවුරුදු සිරිය උදාවෙන්නේ ගැමි පරිසරය තුලය. එය අපි කවුරුත් හොඳින් දන්නා සත්‍යයකි. ගැමි පරිසරය තුල මුළින්ම අවුරුදු පණිවිඩය ගමට රැගෙන එන්නේ කොහා ය. එරබඳු මල් වෙළේ නියරේ වැට දිගට රතු පාටට පිපි මුළු පරිසරයම සුවඳවත්වේ. ගොයම් කපා පාගා අස්වැන්න ගෙට ගොඩකරගත් ගැමියන් තමා වසන ගෙවල් දොරවළඳ ගොම මැටි ගා අළුත් වැඩියා කරති. අළුතෙන් පොල්අතු වහලයට බැඳ බීමට ජලය ලබාගන්නා ළිඳද පිරිසිඳු කරති.

ශ්‍රී ලාංකික ගැමි ජනතාව සතුටට පත්වන ප්‍රීතිමත්වන උත්සව අතරින් සිංහල අවුරුද්ද ප්‍රධානත්වයක් ගනී. මේ සඳහා ඔවුන් සෑහෙන කාලයක සිට සූදානම් වෙති.

සිංහල අළුත් අවුරුද්දේ වැදගත් දිනයකි මුලින් එළැඹෙන පරණ අවුරුද්ද. සුපුරුදු පරිදි කරගෙන ආ වැඩකටයුතු නතර කොට නොනගත කාලයේදී පුණ්‍ය කටයුතුවල යෙදීම ගැමියන්ගේ සිරිතයි. ගැමියන් පමණක් නොව ශ්‍රී ලාංකික සියලුම සිංහල ජනතාව මෙම පුණ්‍ය කාලයේදී විහාරස්ථාන කරා ගොස් මල් පහන් පූජා කොට පින් පුරවා ගනිති.

නොනගත කාලය යනු නැකතත් නොමැති කාලයකි. මේ නිසාම පින්දහම්වල යෙදී කටයුතු කරයි. විශේෂයෙන්ම ගැමි දරුවන් තමන් තෑගි ලැබූ අළුත් ඇඳුම් ඇඳගෙන ගමපුරා ඇවිදිමින් කෙලි සෙල්ලම් කිරීමට අළුත් අවුරුද්දද ලබන තුරා බලා සිටියි.

අළුත් අවරුද්දේ උදාව සියල්ලටම සතුට ප්‍රීතිය උතුරා යන ජීවිතයේ වැදගත් අවස්ථාවකි. එබම වෙලාවක මුළු ලංකාව පුරාම ලිප්වල ගිණි දැල්වෙයි. එමෙන්ම එකම සුභ මොහොතක කිරිබත් පිළියෙල කොට අනුභව කරති. එපමණක් නොව මේ අවුරුදු දා බැඳුන බොහෝ චාරිත්‍රවාරිත්‍ර රාශියක් එලෙසින්ම අනුගමනය කරති. අවුරුදු දා පිළියෙල කරන කෑම මේසය ද විශේෂයක් ගනී. සම්මත කෑම වර්ග විශේෂයෙන්ම පිළියෙල කිරීම අළුත් අවුරුදා සිදුවන විශේෂයෙකි. කෙසෙල් කැන් අවුරුද්දට පෙර ඉඳවා ගැනීම ගැමියන්ට විශේෂ කාර්යකි.

වලක් කපා දුම් පිඹ දවස් කීපයකට පසු අවුරුදු දා ඉදුනු කෙසෙල් කැන් එළියට ගෙන අවුරුදු කෑම මේසය තවත් හැඩ ගන්වයි. ආහාර අනුභව කිරීම ගණුදෙනු කිරීම වැඩ අදළිලීම රැකී රක්ෂා සඳහා පිටත්ව යෑම අවුරුදු දවසේ සිදුවන චාරිත්‍රවලින් කීපයකි. මෙම කෑම මේසයේ ඇති කෑම සෑදීමට පෙරදී ගෙවල් පිරිසිඳු කර ලිප් පිරිසිඳු කර කෑමබීම සිසිකි.

මේ කෑම මේසයට අමතරව අවුරුදු දා ක්‍රීඩා වැදගත් ස්ථානයක් ගෙන තිබේ. මේ අවුරුදු ක්‍රීඩාවල මූලික පරමාර්ථය එකමුතුකම. ජය පැරදුම එකසේ විඳගැනීමට පුරුදු පුහුණුවීම හා

සන්නස සංස්කාරකතුමාගෙන් කරන ඉල්ලීමක්....

සංස්කාරක තුමනි,

මට ලැබෙන සන්නස මිටියෙන් කීපයක් දුර බැහැර සිටින මාගේ සන්නස හිතවතුන්ට යැවීමට මා මුදල් වියදම් කරන්නේ ඉතා කැමැත්තෙනි. සමහර විට ඔවුන් හමු වන කෙනෙකු අත ඒවා යැවීම ද කරනු ලැබේ. සන්නසේ ලිපි කීපයක් ඔවින් ඉතා ආසාවෙන් කියවන බව ඇසීම ඔබටත් සතුටු විය හැකි ආරංචියක් විය හැකිය. බාසාව ගැන මා ලියන ලිපියක් සුබාශිතයේ කවියක් ඔවින් නොවරදවා කියවන බවත්, එයින් යම් යම් දේ ඉගෙන ගන්නා බවත් ඇසීම මට ද සතුටකි.

මා, "යි" වෙනුවට "ය් " ලියන්නේත්, "වු" වෙනුවට (බොහෝ තැන්වල) "ව්" ලියන්නේත් අයේ දැයේ කෙනෙක් අසූ හ. මම හේතුව පහදා දුන්නෙමි. සියබසේ බෙහෙවින් දක්නට ලැබෙන ස්වර ලෝප විදිය අනුව කියති - ලියති වැනි පද කියත් - ලියත් වන බවත්, බැලුම - කැලුම -පිනුම වැනි වචන බැල්ම - කැල්ම - පින්ම/පිම්ම වන බවත් පහදා දුන් මම අයියා අය්යා වන බවත්, අවුව - අව්ව වන බවත් කීවෙමි.

අපට කියවෙන "අය් - යා" ට "ඉ" එකතු වී අය් - ඉ - යා = අයියා හැඳෙන සැටිත්, "අව්ව්" ව" ට "උ" එකතු වී අව් + උ - න = අවුව හැඳෙන හැටිත් ඔහු තේරුම් ගත්හ.

අපට කියවන්නේ අය්යා ද අයියා ද ? මය්නා ද මයිනා ද ? කරය් ද කරයි ද ? එකය් දෙකය් ද එකයි දෙකයි ද ? අව්ව ද අවුව ද, දව්ල ද දවුල ද ? ගිරව් ද ගිරවු (ගිරා + හු = ගිරහු - ගිරවු) ද ? ගයව් වයව් (ගයවු වයවු = ගය + හු - වය + හු) ගයවු වයවු ද ? මම ඔවින්ගෙන් ඇසීමි. තමන්ට හැම විට ම කියවෙන්නේ මුල වචනය බව ඔහු කීහ.

වෘකයා (ව්ඊ - කයා), ගෘහය (ගෑ්ඊ - හය), මෘදු (මිඊ - දු), පෘථිවිය (ප්ඊ - ථි - විය) ලියා, වෘකයා (වුර්කයා), කියන අප ඒ වචන අපට කියවෙන විදියට නොලියන්නේ ඇයි ? ධන, ඵල, භය යන සකු වචන දින, පළ, බිය (බය) යනුවෙන් සිය බසට ඇද ගෙන ඇති විදියට වෘකය, ගෘහය, මෘදු යන සක - වචන වුර්කයා, ග්රැහය (ගෙය), මුර්දු (මුදු) යනුවෙන් සිය බසට ගැලපෙන විදියට ගැනීමේ වරද කුමක් ද ? ඉංගිරිසියේ ඝ්බබශ - රැලිය, ඹඔශ - පැටිය ඊඹශ ?* - බතිස් වැනි වචන ගැන කියන්නේ කුමක් ද ? මම ඔවින්ගෙන් ඇසීමි.

ලබ්බ - පක - පය්ය පැරනි පත පොත්වල පවා ඇති නිවැරදි වචන උවත්, අද අපි ඒ වචන බාවිතා නොකරමු. සමහර කෙටි කතා පොත්වල (ටෙලි - නාට්‍යවල) දක්නට ලැබෙන වේසිගෙ පුතා, බොන්ඩිගෙ පුතා, බැල්ලිගෙ පුතා වැනි වචන අපි නොලියමු. දොඩන කියන විට බාවිතා කරන, ලිංගික ක්‍රියා හා බැඳි වචන අපි සෝදා අපුල්ලා වෙනත් වචන යොදා කියමු. "මහල්ලා දැරියකට අතවර කරය් / දැරියක් මහල්ලකුගේ අතවරයට ලක් වේ" යනු පුවත් පත් වාර්තාවක හෙඩිමකි. අපි කුණු රහ වචන යොදා ඒ සිද්දිය ගැන කතා කරමු. එසේ කතා කරන වචන යොදා අපි පුවත් පතකට වාර්තාවක් නොලියමු.

පස් වැන්නේ ලමයකුවත් නොලියන දුම්මුල් - සදොස් බසින් ලියන ලද, කිසිදු ගැම්මකට නැති ලිපියක් පළ කිරීමෙන් ඒ පුවත් පත හෑල්ලු වේ ; එහි නමට කැලලක් වේ.

පල කිරීම සඳහා එවනු ලබන ලිපි සකස් කොට පල කිරීම බොහෝ පුවත්පත්වල සිරිත උවත්, ජනතා පුවත් පතකට විචිත්‍ර හේතු නිසා එය කිරීම අපහසු බව දකිමි. නඳපු කම් සම හිතවත් කම් නොතකා ඒ ලිපි ඉවත ලෑම හෝ ඒ ලිපි සෝදා එවන ලෙස දන්වා ආපසු යැවීම කාගේ කාගෙත් හොඳ නමට හොඳය. විශේෂයෙන් හොඳ නමක් හදා ගෙන සිටින සන්නසට එය ඉතා හොඳය.

කාලයක් තිස්සේ මහා විශාරදයන් කල කී දෙයක් පුවත් අදට නොගැලපේ නම් සදොස් ලෙස පෙනේ නම් එය වෙනස් කිරීම හෝ නිවැරදි කිරීම ආනන්තරිය පාප කර්මයක් නො වේ. සිදත් සඟරාවේ නොතිබි "ඇ" යන්න අද අපේ හෝඩියට වැදී ඇත.

16 වැනි සිය වස තෙක් පොලොව වටේ ගමන් කල ඉර අද එක්තැන් වී සිටින බවත් පොලොව ඒ වටේ ගමන් කරන බවත් ඔබ දැනිති.

අපේ හෝඩියේත් වියරනයේත් අඩු පාඩු ඇති බවත් එය අදට ගැලපෙන විදියට සකස් විය යුතු බවත් ඇත්තය. එහෙත් එය විදිමත් ව කෙරෙන තෙක් සම්මතයේ ඇති රීති වලට අප අවනත විය යුතු ය.

ණ/ළ/ෂ නොලියා හැරීම එකකි. න-ණ/ල-ළ/ශ-ෂ මාරු කොට වැරදියට ලිවීම අනෙකකි.

අමා වතුරේ ඇති සැබෙවින්, සිද්ධත් කුමාර, ධම්, ධැම්ම් යන වචනවල අල්පප්‍රාන වෙනුවට මහාප්‍රාන අකුරු ලියන ඇත.

මගේ ලියවිලිවල විවිද පාටකයන්, විභාගය, ගෝසාව ලියා ඇත. දෙ දෙනා ම කර ඇත්තේ සමාන වරදක් විය හැකි ය.

වි.ක. ධර්මබන්ධු

සංස්කාරක සටහන

පුවත්පතට ලැබෙන ලිපි අතුරින් ඉහළ මිටිටමක නැති ලිපි පළ කිරීමෙන් පුවත්පතේ ප්‍රමිතිය බාල වන බවට ධර්මබන්ධු ශූරින් ඉදිරිපත් කරන මතයට අපි එකඟ වෙමු. ඒ ලිපි පළකිරීමට පෙර සංස්කරණයට භාජනය කළ යුතු බවට ඒ මහතා ඉදිරිපත් කරන මතයද නිවැරදිය.

පුවත්පතක සංස්කාරකවරුන්ගේ වගකීම පුවත් පතට ලැබෙන ලිපි ඒ ආකාරයෙන්ම පළකිරීම නොවේ. ඒවා සංස්කරණය කරන්නට සංස්කාරකට අයිතියක් ඇත. එය සංස්කාරකවරයාගේ රාජකාරියයි.

එනමුදු ධර්මබන්ධු ශූරින් නොදන්නා පැත්තක් ද ඇති බව පෙන්වා දෙනු කැමැත්තෙමු. ශ්‍රී ලංකාවේ හෝ ලෝකයේ ඕනෑම තැනක ඕනෑම භාෂාවකින් පළවන පුවත්පතක් සංස්කරණය කිරීම සහ ඕස්ට්‍රේලියාවේ සිංහල පුවත්පතක් සංස්කරණය කිරීම යනු අහස පොළොව මෙන් දුරස්ථ කාර්යයන් දෙකකි.

පුවත්පතක සංස්කාරකවරයාගේ රාජකාරිය පහසු නැත .

1 ඔහු පළමුව පළකිරීම සඳහා සුදුසු ලිපි තෝරාගත යුතුය

2 ඒ ලිපි කියවා සංස්කරණයට භාජනය විය යුතු තැන් තෝරාගෙන සංස්කරණය කළ යුතු ය.

3 වියරණ නිවැරදි කළ යුතු ය.

4 සුදුසු "හෙඩිමක්" (මාතෘකාවක්) යෙදිය යුතු ය.

5 පිටුවේ ඉඩ කඩ සහ සැකැස්ම අනුව පහසුකම තිබේ නම් ලිපියේ අන්තර්ගතය තිව්‍ර වන අකාරයේ සේයාරුවක් හෝ රූපයක් යෙදිය යුතු ය.

ඒ සංස්කාරකවරයාගේ නියම රාජකාරියෙන් බිඳකි.

නමුත් ඕස්ට්‍රේලියාවේ සිංහල පුවත්පතක සංස් කාරකවරයාට ඒ කියන ආකාරයේ බලතල පාවිච්චි කරන්නට කිසිදු අවසරයක් නැත.

අප එසේ කියන්නේ අපේ අත්දැකීම් අනුව ය.

පුවත්පතේ පළවූ ලිපියක කොටසක් සංස්කරණය කිරීම පසෙක තබන්න. තමා එවූ ලිපියේ එක වචනයක් අඩුව පළ වුවහොත් ඒ වචනය අඩු කළේ ඇයිදැයි විමසන ඒ පිළිබඳව තෝක්කාඩු කියන ලේඛකයන් අපට සිටින බව ධර්මබන්ධු ශූරින් නොදන්නවා විය හැකි ය.

ලිපියක හෙඩිමක් යෙදීම සංස්කාරකවරයාගේ රාජකාරියයි. එහෙත් ඕස්ට්‍රේලියාවේ සිංහල පුවත් පත් වලට ලිපි එවන බොහෝ ලේඛකයන් ලියා එවන හෙඩිම ඒ ආකාරයෙන්ම පළ නොකළහොත් ඒ පිළිබඳව උත්තර පත්තර බඳින්නටත් සංස්කාරකවරයාට බොහෝ විට සිදුවන බවත් ධර්මබන්ධු ශූරින් නොදන්නවා විය හැකි ය.

පුවත්පතක සංස්කාරකවරයාගේ රාජකාරිය කුමක්ද යන්න පිළිබඳව බොහෝ ලේඛක ලේඛිකාවනට දැනුමක් හෝ අවබෝධයක් හෝ නැති බව අප අත්විඳින යම් යම් සිදුවීම් අපට පෙන්වා දෙයි. මේ බව සමහර ලේඛක ලේඛිකාවනට තේරුම් කරන්නට යාම පවා අප්‍රසන්න අත්දැකීමකි.

මේ කරුණු කාරණා සහ විවිධ හේතු මත ප්‍රසිද්ධියේ සාකච්ඡා නොකළ හැකි තවත් කරුණු කාරණා නිසා ඕස්ට්‍රේලියාවේ සිංහල පුවත්පත් සංස්කාරකවරුන් යනු ලැබෙන ලිපි ගෙඩි පිටින්ම පත්තර පිටු මත අතුරණ යාන්ත්‍රික මිනිසුන් බවට පත්ව ඇති බව ලියන්නට සිදුව ඇත්තේ කණගාටුවෙනි.

ඕස්ට්‍රේලියාවේ බොහෝ සිංහල පුවත්පත් යනු ලැබෙන ලිපි මොනවා හෝ පත්තර පිටුමත අළුවා ඇති කඩදාසි පමණක් යන්න නොකියාම නොහැකිය. කාට හෝ කීයක් හෝ ගෙවා පත්තර පිටු මත ලිපි අලවන රාජකාරිය කරවාගෙන "සංස්කාරක" ලෙස තමන්ගේ නම ගසා ගන්නා සිංහල වාක්‍යයක් නිවැරදිව ලියන්නට නොදන්නා නිර්ලජ්ජී මිනිසුන් බිහිව සිටින්නේත් මේ නිසාම ය.

සන්නසේ අපේ උත්සාහය හැකි තරම් ඉහළ ප්‍රමිතියකින් අපේ පුවත්පත පවත්වාගෙන යාමයි. එය අභියෝගයකි. එනමුදු අප එයට මුහුණ දිය යුතුම ය.

සංස්කාරක